සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 21 S I |
|---|---|---|
| නම: ................................................ | සිංහල භාෂාව හා සාහිත්‍යය I | කාලය පැය තුනයි |

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

01. වෙලේ කඩේ මුදලාලි **ගිනිකන්නෙක්** බව කවුරුත් දනිති.
    1. අච්ච ගැන නොසිතා වැඩකරන්නෙක්
    2. අසාධාරණ ලෙස අය කරන්නෙක්
    3. දුක්මහන්සි වෙලා හම්බ කරන්නෙක්
    4. පෝරණුවක වැඩ කරන්නෙක්

02. **කිරිගහට ඇන්නා වගේ** ශාස්ත්‍රය කියවුණා යැයි අම්මා කීවාය.
    1. වැරදි අන්දමින්
    2. වැරදි කළ අයට වාසිසහගත අන්දමින්
    3. හරියට ම හරිගිය අන්දමින්
    4. අවිශ්වාස සහගත අන්දමින්

03. නවීන තාක්‍ෂණයත් සමඟ චිත්‍ර ශිල්පීන්ගේ **බහින කලාව** උදාවී ඇති බව පෙනේ.
    1. අභාග්‍යවත් කාලය
    2. කලාවේ අවිධිමත් බව
    3. අදක්‍ෂයින් බිහිවීම
    4. පෙරමුණට ඒම

- අංක 4-6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. පුවත්පත තවමත් ජනතාවට තොරතුරු සපයන ප්‍රබල ......................... මාධ්‍යයකි.
    1. අමුද්‍රිත 2. මුද්‍රිත 3. ලිඛිත 4. විද්‍යුත්

05. සැබවින් ම කවියක දුවටුණු ................................ පළ කළ ලෝක පරිමාණයේ මහා කවියා ශේක්ෂ්පියර් ය.
    1. විඥානය 2. අවිඥානය 3. ගීතවත් බව 4. ප්‍රඥාව

06. උසස් රසිකයා, කලාකරුවා හා සමාන මානසික මට්ටමක් ඇතැයි යන අදහසින් ............................ යනුවෙන් හැඳින්වෙයි.
    1. සහෘදයා 2. පාඨකයා 3. ලේඛකයා 4. නිර්මාණකරුවා

07. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
    1. අලුත්වැඩියාව, ඓරාවණ, ආභාසය , නැමෙනසුලු
    2. පිළිතුරු, නිශ්පාදන, ජ්‍යෙෂ්ඨ, නිෂ්ඵල
    3. කොට්ඨාසය, සංස්කාර, සියලු, ගෘහස්ථ
    4. සංදර්ශන, උළෙල, දිලිසුනි, සම්පූර්ණ

08. තීරණය, සාධාරණ, ශූරීන්, වැල්ල යන වචනවල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දක්වෙන වරණය තෝරන්න.
    1. ඇලපිල්ල, දිගු පාපිල්ල, දිගු ඉස්පිල්ල, කෙටි ඇදය
    2. දිගු ඉස්පිල්ල, ඇලපිල්ල, දිගු පාපිල්ල, කෙටි ඇදය
    3. දිගු ඉස්පිල්ල, කෙටි ඇදය, ඇලපිල්ල, දිගු පාපිල්ල
    4. දිගු පාපිල්ල, ඇලපිල්ල, දිගු ඉස්පිල්ල. කෙටි ඇදය

09. 'ධනවත්' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
    1. කණ්ඨජ හා තාලුජ 2. ඕෂ්ඨජ හා මූර්ධජ 3. දන්තජ හා මූර්ධජ 4. දන්තජ හා ඕෂ්ඨජ

10. අකාරාදී පිළිවෙළ නිවැරදි ව දක්වෙන පද පේළිය තෝරන්න.
    1. කැකිරි, කිරි අල, අවර, මැකරල්
    2. නෝකෝල්, පතෝල, බණ්ඩක්කා, වැටකොළු
    3. රතු අල, තිබ්බටු, දඹල, මුරුංගා
    4. පිපිඤ්ඤා, කැරට්, ලීක්ස්, ගෝවා

11. අනුක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
    1. ළමයෙකු, මිනිසෙක්, ගොවියන්, පාලකයින්
    2. සර්පයින්, මුවන්, ගායිකාවන්, මවක්
    3. ගොළුබෙල්ලෝ, පත්තෑයින්, නැඳැයින්, බල්ලා
    4. යෝධයින්, සේවකයින්, නීතීඥයින්, හූනන්

12. "කුරුල්ලා පැටවුන්ට කෑම දුන්නේය. " යන වාක්‍යයෙහි පැටවුන්ට යන්නෙහි විභක්තිය කුමක් ද?
    1. සම්ප්‍රදාන 2. කර්ම 3. ආධාර 4. කරණ

13. "තුන්බිය" යන්න අයත් වන්නේ,
   1. විභක්ති සමාසයට ය.
   2. විශේෂණ සමාසයට ය.
   3. අව්‍ය සමාසයට ය.
   4. ද කාරාර්ථ සමාසයට ය.

14. "විද්‍යාල + ඊය" යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
   1.විද්‍යාලීය
   2. විද්‍යලයීය
   3. විදුහලීය
   4. විද්‍යාලයීය

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
   1. අසම්භාව්‍ය ක්‍රියා - දිව්වොත්, බලද්දී, නැටුවොත් යනවිට
   2. සමාස - දසබල, තෙල්මල්, කිරිබත්, අකුසල්
   3. උපසර්ග - සුපිරිසිදු, පබල, අවමඟුල්. නිලඹර
   4. විධික්‍රියා - නටන්න, දුවනු, යන්න, එනු

16. පූර්ව ක්‍රියාවන් යෙදී නැති වාක්‍යය තෝරන්න.
   1. වඳුරා ගසට පැන අඹයක් කඩා කෑවේ ය.
   2. නිමල් පන්තියට පැමිණෙන විට වැස්සක් ඇදහැළිණි.
   3. ගොවියා කඹාඩුව බැඳ ගෙදර ආවේ ය.
   4. වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කර බෙහෙත් ලිව්වේ ය.

- **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

17. ඇ **තුදුස්** වැනි වියේ ගත කරන රුවැත්තියෙකි.
   1. දහතුන
   2. දාහතර
   3. පහළොව
   4. දහසය

18. **අධි වාසනා ගුණය** කාන්තාවක සතු ආභරණයකි.
   1. ඉවසීමේ ගුණය
   2. සහජ වාසනාව
   3. අරපිරිමැස්ම
   4. වාසනා ශක්තිය

19. ඔහු **විදග්ධ** පඬිවරයෙකි.
   1. අව්‍යක්ත
   2. විරුද්ධ
   3. නිපුණ
   4. තියුණු

20. **දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.**
   1. අකුර, වචනය, වාක්‍යය, ඡේදය
   2. ශිෂ්‍යයා, ගුරුවරයා, පන්ති කාමරය, පාසල
   3. අනුප්‍රාසය, එළිසමය, විරිත, තාලය
   4. විධික්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්ව ක්‍රියා, තද්ධිත

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   1. විලස - අයුරු, රිටුන් - විදේශිකයින්, පවර - උතුම්, නැණ - ඥානය
   2. සමය - ආගම, සත් - යහපත් , මධුර-මිහිරි, විලිකුන් - ඉදුණු
   3. නල-සුළං, කුළක් - පර්වතයක් , අග්නි-ගිනි, රුහිරු - සූර්යයා
   4. රිසි-කැමති, නියත - සුදුසු, ප්‍රහර්ෂය-සතුට, අරුත්- අර්ථ

22. මුලින් දී ඇති පදයට සමානාර්ථ පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   1.සක්දෙවි - ඉඳුරු, තිදසිඳු, සුරපති, සක්
   2. පුදුමය - විස්මය , අරුමය , ආශ්චර්ය, සංකාව
   3. වනිතා - අනඟි, සුරූපී, අනර්ඝ, මහඟු
   4. මුහුද - ජලනිධි, ජලජ , සිඳු, රුවනාර

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
   1. නියුක්ත - යුක්ත
   2. කෘතවේදී - අකෘතඥ
   3. අලස - අනලස
   4. ආධුනික - ප්‍රවීණ

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
   1. "තෙපි" යනු මධ්‍යම පුරුෂ බහුවචන උක්ත නාම පදයකි.
   2. "විදේශීය" යන්න තද්ධිත පදයෙහි "ඊය" යන ප්‍රත්‍ය යෙදී ඇත.
   3. "තොමෝ" යනු ස්ත්‍රීලිංග බහුවචන නාම පදයකි.
   4. "ම" යනු අවධාරණාර්ථයේ නිපාත පදයකි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍ය තෝරන්න.
   1. සම්මත වැඩිදෙනා ලේඛන ව්‍යවහාරය ඇතමෙක් අනුගමනය කරද්දී භාෂණ ව්‍යවහාරය අනුගමනය කරති.
   2. සෞඛ්‍ය සේවක ජනතාවාදී හා ඖෂධ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමෙන් සමාජයක් සෞඛ්‍ය සම්පන්න කළ හැකිය.
   3. ඉදිරිපත් කිරීමට නියමිත කාරණාව සඳහා සම්ප්‍රේෂණය කිරීමට මාධ්‍යයක් තෝරාගැනීම. ඒ සඳහා ඉවහල් වේ.
   4. විද්වත් මණ්ඩල සාකච්ඡාවක් මෙහෙයවන තැනැත්තා ද එම විෂය ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමකින් යුක්ත අයෙකු විය යුතුය.

- **අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

26. යහපත් දේට යහපත් දෙයක් එක්වීමෙන් එය ඉතා යහපත් වේ.
    1. ලුණුවයි කණුවයි වගේ.
    2. රයිගමයයි ගම්පලයයි වගේ
    3. නරියට කුකුල් කොටුව භාර දුන්නා වගේ
    4. කිරිමුහුදට හඳ පෑව්වා වගේ

27. උදව්වක් කර යමක් බලාපොරොත්තු වීම
    1. අගේ ඉදන් කන කනවා වගේ
    2. අත දීල දත නියවනව වගේ
    3. දිය යටින් ගින්දර ගෙනියනවා වගේ
    4. පුංචි අම්මත් ඇවිත් කැවුම් පුංචි කළා වගේ

28. පරස්වර ලෝප සන්ධිය හා ද්විත්වරූප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
    1. කුරුල්ලා, කොග්ගල
    2. මුනිතුමා - නිරිඳු
    3. සුරඟන - කුරුල්ලා
    4. පුරඹර - නළඟන

- **අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවලට ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

29. 1. සාමාජිකයෝ යෝජනාවට පක්ෂ වෙති' යි අපි සිතුවෙමු.
    2. සහෝදරිය හෝ මම ශ්‍රමදානයට සහභාගී වෙමි.
    3. දරුවෝ පැමිණියහොත් ක්‍රීඩාව ආරම්භ වේ.
    4. ඔවුහු එම ආයතනයේ නියෝජිතයන් වෙති.

30. 1. පරිසරවේදීහු නැවත රැස්වන්නේ කෙදිනක ද?
    2. සංවිධායකයෝ අවශ්‍ය භාණ්ඩ සපයා ඇත.
    3. වෛද්‍යවරියක විසින් රෝගීහු දූනුවත් කරනු ලැබූහ.
    4. මහීහු මාර්ග නීති පිළිපැදීම මැනවි.

31. •සරණාගතයෝ ආහාර ලබාගනු ................ නගරයේ ඇවිදිති.
    •කලට වැසි ලැබුණු .............. ගොවියෝ වැඩ ඇරඹූහ.
    •පසුගිය සතියේ ................ ලෝක වෙළඳපොලේ බොරතෙල් මිල ඉහළ ගියේ ය.
    •සටන් විරාමයකට අකමැති .................. ප්‍රබලයෝ පවසති.
    ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
    1. පිණිස, බව , සිට , නිසා
    2. නිසා, සිට , පිණිස , බව
    3. පිණිස , නිසා , සිට , බව
    4. නිසා , පිණිස , සිට , බව

32. පහත වාක්‍යයෙහි ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
    "නෑයො එනකොට උත්සවය පටන්ගෙන තිබුණා"
    1. ඥාතීන් පැමිණෙන විට උත්සවය ඇරඹී තිබුණි.
    2. ඥාතීහු පැමිණෙද්දී උත්සවය ඇරඹී තිබුණි.
    3. ඥාතීහු පැමිණෙද්දී උත්සවය ඇරඹෙයි.
    4. ඥාතීන් ආවා ම උත්සවය ඇරඹුණි.

33. "සුභාෂිතය, සැවුල් සන්දේශය, කුස ජාතක කාව්‍ය යන නිර්මාණ ග්‍රන්ථ රචකයා වන්නේ,
    1. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
    2. අලගියවන්න මුකවෙටිතුමා
    3. විද්‍යාචක්‍රවර්තී
    4. වීදාගම මෛත්‍රීය හිමි

34. පහත දැක්වෙන කවියේ හතරවන පදය දැක්වෙන වරණය තෝරන්න.

    වෙර වීරිය ඇතත් හිතේ
    පියකරු බව ඇතත් ගතේ
    දහදිය නොම සැලෙන ගතේ
    ..............................................................

    1. මව්බිම දෙස බලන් පුතේ
    2. ඔබ පොළවට බරකි පුතේ
    3. පෙර විරුවන් ඔබගෙ පුතේ
    4. දෑ උරුමය ඇතිව සිතේ

35. "දෙයක් වේ නම් - සුදුස්සාටම අයිති විය යුතු.
    මකියන ලෙස මෙලෙද - ලැබිය යුතු අයමය ලැබිය යුතු" මෙම පද්‍ය ඇතුළත් නාට්‍ය වන්නේ,
    1. සිංහබාහු
    2. දුන්න දුනුගමුවේ
    3. තලමල පිපිලා
    4. හුණුවටය

36. "සාහිත්‍යකරුවා භාෂාව භාවිත කරනුයේ" **භාවික ගුණයෙන්** යුතුව ය.
    ඉහත පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත කොටසෙහි අර්ථය වන්නේ,
    1. බාහිර අර්ථ ගැන්වෙන ආකාරයෙන්
    2. අතිශයෝක්තිය දැනෙන ආකාරයෙන්.
    3. හැඟීම් ප්‍රබෝධ වන ආකාරයෙන්.
    4. ව්‍යවහාරයේ පවතින ආකාරයෙන්.

37. උපමාවක් යෙදී නැති වරණය තෝරන්න.
   1. පැහැසරණිය මිණිපැමිණිය කොත් අගට
   2. දවසපුරා දිව වහළෙව් උදයවරා
   3. කන්නට පැන්නා මෙන් වැලහින්නී
   4. සැලෙන පහන සිළු වැනි රඟ ලිය සැදී

38. මහේන්ද්‍ර, යසෝමා යන චරිත ඇතුළත් කෙටි කතාව වන්නේ,
   1. මංතනන්නෝ  2. වතුරමල  3. තොරොක්කෝව  4. වහල්ලු

39. කමත් භාෂාවේ දී වී මැනීම සඳහා භාවිත කළ උපකරණය හැඳින්වූයේ,
   1. යතුර යනුවෙනි.  2. මාගල යනුවෙනි.  3. උප්පිඩ යනුවෙනි.  4. කුටාලම යනුවෙනි.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට සමීප අදහස් දෙන පිළිතුර තෝරන්න.
දහනවවැනි ශත වර්ෂයේ ද්විතීය භාගයේ දී බහුල වශයෙන් කෙටි ප්‍රබන්ධ කතා පරිවර්තනය කෙරුණේ පුවත්පත්වල පැවැත්ම සඳහාත් පාඨක රුචිය සපුරාලීම සඳහාත් ය.
   1. පුවත්පත්වල පැවැත්ම වඩාත් හොඳින් සිදුවූයේ දහනවවැනි ශත වර්ෂයේ අවසානයේ ප්‍රබන්ධ කතා එක්කිරීම හේතුවෙනි.
   2. පාඨක රුචිය ඇති කිරීම සඳහා දහවනවන ශත වර්ෂයේ මැදභාගය වන විට මෙරට පුවත්පත් බිහිවිය.
   3. පුවත්පත්වල පැවැත්ම හා පාඨක රුචිය සපුරාලීමත් සඳහා ප්‍රබන්ධ කතා පළ කිරීම දහනවවැනි ශත වර්ෂයේ දෙවැනි භාගයේ සිදුවිය.
   4. ප්‍රබන්ධ කතා පරිවර්තනය කෙරුණේ දහනවවැනි ශත වර්ෂය ආරම්භයේ දී පුවත්පත් පළ කිරීම හේතුකොට ගෙන ය.

* * * * * *

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 21 S II

නම: ......................................... **සිංහල භාෂාව හා සාහිත්‍යය II** [redacted]

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.
- අංක (i) සිට (x) දක්වා ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) i. (අ) සංයුක්ත ස්වර දෙක ලියන්න.
(ආ) අඝෝෂ ව්‍යඤ්ජන අක්ෂර දෙකක් ලියන්න.

ii. පහත සඳහන් වාක්‍යවල ඇතුළත් අවධි විභක්තියට අයත් වචන දෙකක් ලියන්න.
(අ) ඊශ්‍රායලය හා පලස්තීන් යුද ගැටුම නිසා ජනතාව ගාසා තීරයෙන් ඉවත්ව යති.
(ආ) නොදනිත් දරුවන් ඇකයෙන් වැටුණා.

iii. පහත සඳහන් පද නිවැරදිව සන්ධි කර ලියන්න.
(අ) නීති + අනුකූල (ආ) අරුණ + අලු

iv. පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
" වාග් විලාශය යනු ලේඛකයා ඔහුට ආවේණික වාග් කෝෂයෙන් වර්ණනා කෙරෙන අවස්ථාවට යෝග්‍ය වන වචන තෝරා ගෙන එය සිය ලේඛණය ගොඩ නැගීමයි."

v. පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) මුල සිට අග දක්වා වැඩිවන ආකාරය (ආ) කෙනෙකු කළ සේවයට ගරු කිරීම.

vi. පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.
(අ) සනත් ජයසූරිය හයේ පහර ගසද්දී ප්‍රේක්ෂකයන් ඔල්වරසන් හඬ දුන්හ.
(ආ) ඇමරිකානුවෝ අඟහරු මතට යානාවක් යවයි.

vii. පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) සදාචාර (ආ) ආයුධ

viii. පහත සඳහන් යෙදුම්වල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) "බලවු පොළොන්නරු අනුරාපුර පෙදෙස"
(ආ) වැසි වදිද්දී ඔහු වහා ගෙට ගියේ ය.

ix. පහත සඳහන් යෙදුම්වල පළමු වැනි වචනය සමඟ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවැනි වචනය සකස් කරන්න.
(අ) ව්‍යාකරණ දොස් (ආ) මනුෂ්‍ය සිරුර

x. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) සාහිත්‍යකරුවෝ රසිකයන් අපූරු ලොවකට ගෙන යති.
(ආ) අනාථ දැරිය ඇගේ සහෝදරියන් හඳුනා ගත්තාය. (ලකුණු 02x10=20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය, රටේ ඉතිහාසයේ පෙර නොවූ විරූ අයුරින් දරුණුතම සන්ධිස්ථානයකට පැමිණ ඇත. රටේ ජනගහනයෙන් බහුතරයක් මෙයින් පීඩා විඳින අතර විශේෂයෙන් තරුණයින් ශ්‍රී ලංකාව තුළ පවතින ජීවන මට්ටම උසස් කර ගැනීමට අවශ්‍ය අවස්ථා පිළිබඳ සෑහීමකට පත් නොවී ඇති බව ශීඝ්‍රයෙන් සිදුවන විදේශගත වීමෙන් කියාපායි. තරුණයින් විදේශගතවීම තුළින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලැබුණත් ඒ තුළින් ඇති විය හැකි අර්බුද රාශියකි. එනම් බුද්ධි ගලනය මෙන් ම රටක වැඩකළ හැකි ජවසම්පන්න තරුණ ශ්‍රමය රටට අහිමි වීම ද එක් අතකින් දරුණු ව්‍යසනයකි. එමෙන් ම සමාජීය අර්බුද ගොඩ නැගීමට ප්‍රබල හේතුවක් ද වෙයි.

(ආ) ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන ක්‍රමය සම්බන්ධයෙන් එල්ලවන ප්‍රබල චෝදනාවක් වනුයේ යල්පැන ගිය අධ්‍යාපන ක්‍රමයක් තිබෙන බවයි. පංති කාමරයෙන් පමණක් අධ්‍යාපනය ලැබීමෙන් සමාජයට අවශ්‍ය ආර්ථිකයට අවශ්‍ය දරුවෙකු බිහි නොවන බව පිළිගනියි. නිර්මාණශීලීත්වය නව උත්පාදන චින්තනය හා ව්‍යවසායකත්ව මනසකින් යුත් හා විචක්ෂණශීලී චින්තනයකින් හා ගැටලු විසඳීමේ හැකියාවකින් යුත් සහයෝගීතාවයෙන් යුත් දරුවෙකු වර්තමාන අධ්‍යාපනයෙන් බිහි නොවන බව කියවේ.

(ඉ) මිනිසාගේ මනසට හා සිතිවිල්ලට බලපෑම් කිරීමේ හැකියාව කලාව සතු බව බොහෝ දෙනාගේ මතයයි. කලාව යනු සෝවියට් දේශයේ ගත්කතුවරයෙකු වන "මිහයිල්සොලහවු" පවසන්නේ මිනිස් සිත්සතන් සුභාවිතව ආමන්ත්‍රණය කළ හැකි සුන්දරතම හා එකම මාධ්‍ය කලාව යන්නයි. මෙරට ජන සමාජයට බලපෑමක් ඇති කරන ප්‍රබල විද්‍යුත් මාධ්‍යයක් ලෙස රූපවාහිනිය හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාවේ ටෙලි නාට්‍ය කලාව කර්මාන්තයක් ලෙස පරිහාණිය දක්වා ගමන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙගා ටෙලි නාට්‍ය රැල්ල ආරම්භ විය. එහි ප්‍රතිඵලය දුර්ධාන්ත නිර්මාණයක් සැබෑලෙස පිළිගන්නා පරපුරක් නිර්මාණය වීම තුළින් සියලු සමාජ හර පද්ධතීන් බිඳ වැටීමයි.

(ඊ) වර්තමානයේ පරිසර දූෂණය සම්බන්ධයෙන් නව මාතෘකාවක් ලෙස ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු වෙමින් පවතී. දශක ගණනාවක සිට ශ්‍රී ලංකාව තුළ විශාල ලෙස ගොඩගැසෙමින් පවතින ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය පිළිබඳ අදාළ අංශයන්ගේ විශේෂ අවධානය කඩිනමින් යොමු නොවුනහොත් විශාල පාරිසරික හා සමාජීය ගැටලුවක් ඇති විය හැකි බවත් එය සියලු ජීවීන්ට අහිතකර බලපෑම් ඇති වන බවත් පරිසරවේදීහු පවසති. ඒ අනුව ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය මහත් ව්‍යසනයක් වීමට පෙර මේවා නිසිලෙස එක්රැස් කිරීම යළි ප්‍රයෝජනයට ගතහැකි කොටස් වේ නම් අදාළ ස්ථානවලට යොමු කිරීම. ප්‍රතිචක්‍රීකරණය කිරීම පිළිබඳ දැඩි අවධානය යොමු විය යුතු ය.

(ලකුණු 25)

(03) පහත ඡේදය වචන 65-70 වන සේ සාරාංශ කොට ලියන්න. ඡේදය අවසානයේ වචන ගණනද ලියා දක්වන්න.

සිංහල වැනි නූතන භාෂාවක් ඉගැන්වීම සඳහා සියවස් ගණනාවක් පැරණි ව්‍යාකරණයක් යොදාගැනීමේ අනිෂ්ට විපාක පවා පෙන්වා දෙමින් සිංහල භාෂාව සඳහා නව ව්‍යාකරණයක අවශ්‍යතාව කුමාරතුංග මහතා අවධාරණය කළේය.එම ප්‍රයත්නයෙහි මුල් ම ප්‍රතිඵලය වූයේ 1936 දී " කුමාර ව්‍යාකරණය" නමින් ග්‍රන්ථයක් පළ කිරීමයි. මේ කෘතිය පිටු පන්සිය ගණනකින් සම්පූර්ණ කිරීමේ අපේක්ෂාව ඇතිව ආරම්භ කළ විශාල කෘතියක් වුවත් පළ වූයේ පළමු කාණ්ඩය පමණි. එහි ප්‍රථම භාගය ඇතුළත් වූයේ ''අක්ෂර කාණ්ඩය'' ''පද කාණ්ඩය'' යන කොටස් පමණි. එමෙන්ම අක්ෂර මාලාව 'අක්ෂර විධි' 'අක්ෂර සන්ධි' යන කොටස් යටතේ ඇතුළත් කළ අභ්‍යාස ප්‍රශ්න රාශියක් ද එයට එක් කළේය. සිදත් සඟරාව ඇතුළු පාරම්පරික ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි දක්වුණු බොහෝ වියරණ විධි විමසුමට ලක් කෙරෙන ප්‍රශ්න ඒ අතර විය. එමෙන් ම පුරාණයේ දී පන්සල්වල සිංහල ඉගැන්වීමේ දී යොදා ගැනුණු 'හෝඩිය' 'නම් පොත' 'මඟුල් ලකුණ' සහ 'සකස්කඩ' යන පොත් ශෝධනය කොට පළකළ කුමාරතුංග මහතා එම පොත් වෙනුවට දරුවන්ට අකුරු උගන්නට උපකාර වන අකුරු සැහැල්ලු නමින් අලුත් පොතක් ද පළ කළේය.

ව්‍යාකරණ රීති ආදිය පිළිබඳව කුමාරතුංග මහතා දැරූ මත ද වරින් වර වෙනස් විය. සිංහල භාෂාවේ ව්‍යාකරණ විධි අරබයා විවරණ පොත්වල දක්වූ ඇතැම් අදහස් ඔහු පසුකාලීනව වෙනස් කළේ ය. භාෂාව හා ව්‍යාකරණය පිළිබඳ නව අර්ථකථන ලබා දුන්නේ ය. මේ බව ඔහු ලියූ විවරණ ග්‍රන්ථවලින් ද අනෙකුත් ලේඛනවලින් ද පැහැදිලි වේ.

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුරාධපුර යුගයේ ආරම්භයේ සිටම ශ්‍රී ලංකාව වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රචලිත ව පැවතිණි. ඇතැම් ඉතිහාසඥයන් ප්‍රකාශ කරන අන්දමට ඉන්දු ආර්යයන් ශ්‍රී ලංකාවට මුලින් පැමිණ ඇත්තේ ද වෙළඳ කටයුතු සඳහා ය. වයඹ දිග වෙරළේ කිමිදී ගනු ලැබූ මුතු ද, උතුරේ මුහුදින් ලැබුණු සක් බෙල්ලන් ද ශ්‍රී ලංකාවට පැමිණි වෙළෙඳ නැව්වලින් ගෙන යන ලද ප්‍රධාන ද්‍රව්‍ය වන්නට ඇත. එහෙත් බටහිර හා දකුණේ නැව් තොටුවලට එන්නට වෙළෙඳ නැව්වලට මඟ පෙන්වූ ධ්‍රැව තාරකාව වන්නට ඇත්තේ දකුණේ කඳුකර ප්‍රදේශවලින් ලැබුණු මැණික් ය. ශ්‍රී ලංකාවට "රත්න දීප" යන නම ලැබුණේ ද මැණික් නිසාමය. ඇතුන් හා ඇත්දත් ආදිය ලංකාවෙන් පිටරට යවන ලද වෙනත් භාණ්ඩ අතර විය.

විදේශ වෙළෙන්දෝ රත්රන් ,රිදී, තඹ, වීදුරු පබළු, උසස් මැටි බඳුන් වර්ග, මත්පැන් හා අශ්වයන් මෙහි ගෙනාවෝ ය. භාතිකාභය රජු රෝමානුක්ඛ නම් රටට දූතයන් යවා පබළු ගෙන්වා ගෙන, ඒවායින් දැලක් තනවා රුවන්වැලි සෑය අලංකාර කළ බවත් අපේ වංශ කථාවල සඳහන් වේ. මේ පුවතේ සඳහන් වන්නේ රෝමයේ රජ කළ ඔගස්ටස් රජුගේ කාලයේ දී සිදු වූ සිදුවීමක් බව දැන් පිළිගෙන ඇත. මෙලෙස අපේ රටේ

අන්තර්ජාතික වෙළෙඳ මධ්‍යස්ථානයක් පැවති බවත්, වරාය තීරුබදු අය කිරීම සඳහා පත්කළ නිලධාරීන් සිටි බවත් අම්බලන්තොට අසල ගොඩවායෙන් හමුවූ සෙල් ලිපියෙන් තහවුරු වී ඇත.

1. මෙම ඡේදයේ සඳහන් පරිදි ඉන්දු ආර්යන් ශ්‍රී ලංකාවට පැමිණ ඇත්තේ කුමක් සඳහා ද?
2. මෙහි සඳහන් පරිදි ආනයනය කළ ප්‍රධාන ද්‍රව්‍ය 2 ක් ලියන්න.
3. ශ්‍රී ලංකාව ආනයන අපනයන කටයුතු මැනවින් සංවිධානාත්මකව කළ බවට හෙළි කරන ප්‍රබල පුරාණ සාධකය කුමක් ද?
4. වෙළෙඳුන් බටහිර හා දකුණේ නැව්තොටුවලට පැමිණියේ මැණික් ලබාගැනීමේ අපේක්ෂාවෙන් බව හෙළි වන කොටස උපුටා දක්වන්න.
5. රෝමයේ රජකළ ඔගස්ටස් රජුගේ කාලයේ ශ්‍රී ලංකාවේ සිදු වූ විශේෂ සිදුවීම කුමක් ද?

(ලකුණු 02x5= 10)

(05) ආහාර කල්තබා ගැනීමේ දී ඉතා ම ප්‍රචලිත ක්‍රමයක් වන්නේ ආහාර විජලනයට ලක් කිරීමයි. මීට දශක කිහිපයකට ප්‍රථම ගින්දරෙන් හා අව්වෙන් අප පරිභෝජනය කරන පලතුරු එළවළු වර්ග වියළා කල්තබා ගැනීමට ජනතාව පුරුදුව සිටියහ. අධික කාර්යබහුල ජීවිතයක් සමඟ එම ආහාර කල්තබාගැනීමේ සාම්ප්‍රදායික ක්‍රම භාවිතයෙන් ඉවත් වූ අතර විශාල වශයෙන් ආහාරයට ගතහැකි එළවළු පලතුරු විනාශ වන්නට විය. මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ "විදාතා" මධ්‍යස්ථානය මඟින් විදුලියෙන් වියලන යන්ත්‍ර හඳුන්වා දීම, පුහුණු කිරීමත්, ඒවා ඇසුරුම්කරණය සම්බන්ධයෙන් පුහුණුවක් 2024.02.30 දින පෙ.ව. 9.00 ට බක්මීවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විදාතා හා තාක්ෂණ කටයුතු සම්බන්ධ නිලධාරී ඔබ යැයි සිතා ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට අත්පත්‍රිකාවක් නිර්මාණය කරන්න.

නැතහොත්

ඔබ විද්‍යාලයේ කලා උළෙල පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත. මෙහි දී ඉදිරිපත් කෙරෙන වැඩසටහන් පිළිබඳ න්‍යාය පත්‍රයක් සකස් කළ යුතුය. කලා සංගමයේ ලේකම් ඔබ යැයි සිතා අවශ්‍ය අංග ඇතුළත් කරමින් කාල කළමනාකරණය කෙරෙහි සැලකිලිමත් වෙමින් සුදුසු න්‍යාය පත්‍රයක් පිළියෙල කරන්න.

(ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 21 S III

නම: ..........................................

# සිංහල භාෂාව හා සාහිත්‍යය III

කාලය පැය දෙකයි

වැදගත් :
- දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1,2,3,4 ප්‍රශ්නවලටත් 5, 6,7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

- අංක (i) සිට (x) දක්වා ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) i. "ඒ එක්කම මේ දුලබ දර්ශනය තරඹමින් ඔහු පසු පස්සේ වැටී යති"
(අ) මෙම කොටස ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) ඉහත කොටසේ ඇතුළත් 'ඔහු' ලෙස නම්කර ඇත්තේ කවරහුද?

ii. "අඩසඳ මෝරන මැදියම් අහසින් බිලිඳු හදට කිරි දියර ගලයි ....."
(අ) මෙම පද්‍ය ඛණ්ඩය ඇතුළත් කාව්‍ය සංග්‍රහය කුමක් ද?
(ආ) එම කාව්‍ය සංග්‍රහයේ කතුවරයා නම් කරන්න.

iii. (අ) රත්නශ්‍රී විජේසිංහයන්ගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය කුමක් ද?
(ආ) රත්නශ්‍රී විජේසිංහයන්ට ජපානයෙන් හිමි වූ සම්මානය කුමක් ද?

iv. එල්ලවෙන්ට කවි කර කීවෙමි බොහොම
කොල්ල කන්ට එති සිවුපාවෝ බොහොම
.................................................................
.................................................................

ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

v. "එසේ වන්නා මෙ විදර්ශනා වඩා රාත් බැව් ගන්නී" යි පැවිජි වූ තැන් මුල් කොටැ...."
(අ) මෙම කොටස ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතිය රචනා වූ යුගය කුමක් ද?

vi. 'සමණෝ ද එ සෙ නොකිව" යි නොකියා එසේ සැටි යැ' යි කියා උන් කීවාම ගිවිස ගෙන නික්මුණාවු ය.
(අ) මෙම කොටස ඇතුළත් වන්නේ කුමන කෘතියේ ද?
(ආ) එම කෘතියේ කතුවරයා නම් කරන්න.

vii. (අ) ජාතක පොත ඇසුරෙන් රචිත කාව්‍ය ග්‍රන්ථ දෙකක් ලියන්න.
(ආ) පන්සිය පනස් ජාතක පොත රචනා වූයේ කුමන රජු දවස ද?

viii.(අ) සිව්පද කාව්‍ය ග්‍රන්ථ අතර අවසාන පුරුක ලෙස සැලකෙන කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?
(ආ) දැනට හමු වී ඇති පැරණි ම සිංහල කෘතිය කුමක් ද?

ix. .................................................................
සරහැර සියොතුන් වියපත් විදමිනි
පුරඹර වසමින් සිටි රඟ කුම් වැනි
සුර සෙනඟට සුරසුන් පැන වූ වැනි
(අ) ඉහත පද්‍යයේ පළමු පද පේළිය සම්පූර්ණ කරන්න.
(ආ) කළු අකුරින් මුද්‍රිත පද පේළියේ යෙදී ඇති කාව්‍යාලංකාරය ලියන්න.

x. (අ) එච්.එම්. කුඩලිගම කවියා රචනා කළ කාව්‍ය ග්‍රන්ථයක් සඳහන් කරන්න.
(ආ) එච්.එම්. කුඩලිගම කවියා පද්‍ය නිර්මාණ සඳහා යොදාගත් තේමාවක් ලියන්න.

(02) i. පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

**පටන්** සුරිඳු දුන් උපදෙස් සිහි කොට
**ඉටන්** බෙලෙන් දුමුවෙන් ගුළි අහසට
තුටන් වඩන සුර අඟනෝ බැස සිට
පටන් ගත්තු නවසියයක් නැටුමට

(අ) කළු අකුරින් මුද්‍රිත පදවල අරුත් ලියන්න.
(ආ) සමස්ත කවියේ අදහස සරල බසින් ලියන්න.

ii. "මේ ගැන ඔහු කල්පනා කර තිබුණේ නැත; ඔහු ගොත ගැසුවේ ය.
(අ) මෙහි සඳහන් ඔහු යනු කවුරුන් ද?
(ආ) මින් අනතුරුව ඔහු ප්‍රකාශ කළේ කුමක් ද?

iii. "මනුෂ්‍යයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යෝධයනට සිනා සිසී **වෙහෙසෙන්නාහු** කොල දර නැතිව පිස කෑ නොහී **සයින්** පීඩිත වැ නොහිඳ නැති කෙනෙක් උළුකැන් බත් ආදිය පිස කව බොව"
(අ) කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) මේ හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

iv. පවන' ද පිපි තුරේ ය නිර තුරේය
කුසුමන් පෙති තුරේ ය මළු තුරේය
අවට සුපිපි සරේ ය බිඟු සරේය
සිත එ වෙහෙර කෙරේ ය ලොබ කෙරේය
(අ) විහාරය අවට පරිසරයේ ස්වාභාවය කෙටියෙන් ලියන්න.
(ආ) දුටු අයගේ සිත් වශී කරවන මේ විහාරය කුමක් ද?

v. කෙසේ වුවද මෙය මට ම තනිකර තබා ගැනීමට තරම් 'බර වැඩි' අත්දැකීමක් විය. පිට යාළුවකුට එය නොකිය හැකිය"
(අ) මෙසේ සිතන්නේ කවුරුන් ද? මොහු ලැබූ අත්දැකීම කුමක් ද?
(ආ) මොහු ලැබූ අත්දැකීම ප්‍රකාශ කරන ලද්දේ කවුරුන්ටද?

(03) i. අමාවතුර කතුවරයා දැක්වූ දක්ෂතාව එහි භාවිත,
i) භාෂා ශෛලියත්,
ii) අවස්ථා හා සිද්ධි නිරූපණයත්,
මඟින් ප්‍රකට වේ. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.
නැතහොත්
ii. සැළලිහිණි සන්දේශ කතුවරයා
i) විවිධ අවස්ථා වර්ණනයෙහි ලා දැක් වූ සමත්කමත්,
ii) මඟ වැනුම්වලදී ස්වභාවෝක්තියට මුල් තැනදී ඇති අයුරුත්,
නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

(04) i. සුප්පාදේවියගේ චරිතයෙනුත්,
ii. සිංහයාගේ චරිතයෙනුත්
දාරක ස්නේහය නිරූපණය වේ. ඔබට නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.
නැතහොත්
i. ජාතිකාභිමානය හා ශ්‍රමාභිමානයත්
ii. අතීත ශ්‍රී විභූතියත්,
මැනවින් යොදා ගැනීමට නිර්මාණකරුවා සමත් වී ඇත. "දෑතේ කරගැට සිඹ සනසන්නට" පද්‍ය නිර්මාණය ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙකක් දක්වමින් පැහැදිලි කරන්න.

(05) වස්සානය නිසා ඇති වූ පිබිදීම චමත්කාරජනක ජීවමාන පරිසර වර්ණනාවකින් ඉදිරිපත් කිරීමට කවියා මහත් සමත්කමක් දක්වයි. වස්සානය කාව්‍ය පන්තිය ඇසුරින් නිදසුන් තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

(06) "උම්මග්ග ජාතකය තුළ විනාශකාරී වචන භාවිතය තුළින් පැහැදිලි වන්නේ සමාජයකට එය හානිවිය හැකි බවයි. මෙම කියමන නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් දක්වමින් විස්තර කරන්න.

(07) කුරක්කන් වගාවේ දී දැඩි වෙහෙසක් දරා අභියෝග ජයගන්නා බව අව්‍යාජව ප්‍රකාශකරයි. කුරක්කන් කවි ඇසුරෙන් උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

**සිංහල භාෂාව හා සාහිත්‍යය**
**11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 1 - 2 | 11 - 4 | 21 - 2 | 31 - 3 | |
| 2 - 3 | 12 - 1 | 22 - 1 | 32 - 1 | |
| 3 - 1 | 13 - 2 | 23 - 1 | 33 - 2 | |
| 4 - 2 | 14 - 4 | 24 - 3 | 34 - 2 | |
| 5 - 4 | 15 - 3 | 25 - 4 | 35 - 4 | |
| 6 - 1 | 16 - 2 | 26 - 4 | 36 - 3 | |
| 7 - 3 | 17 - 2 | 27 - 2 | 37 - 1 | |
| 8 - 2 | 18 - 1 | 28 - 3 | 38 - 1 | |
| 9 - 4 | 19 - 3 | 29 - 2 | 39 - 2 | |
| 10 - 2 | 20 - 4 | 30 - 3 | 40 - 3 | (1x40 = 40) |

## II පත්‍රය

(01) i. (අ) ඓ, ඖ
(ආ) ක, ච, ට, ත, ප
බ, ජ, ඩ, ථ , එ
ශ, ෂ, ස, ෆ

ii. (අ) ගාසාතීරයෙන් (ආ) ඇකයෙන්
iii. (අ) නීත්‍යනුකූල (ආ) අරුණලු
iv. (අ) විලාසය , ලේඛනය
v. (අ) අනුලෝම / ආරෝහණ (ආ) උපහාරය
vi. (අ) සනත් ජයසූරිය හයේ පහර ගසද්දී ප්‍රේක්ෂකයෝ ඔල්වරසන් හඬ දුන්හ.
(ආ) ඇමරිකානුවෝ අඟහරු මතටයානාවක් යවති.
vii. (අ) සදාචාර - දුරාචාර , ආයුධ - නිරායුධ
viii. (අ) විධික්‍රියා (ආ) අසම්භාව්‍ය ක්‍රියා / කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
ix. (අ) වියරණ දොස් / ව්‍යාකරණ දෝෂ (ආ) මනුෂ්‍ය ශරීරය / මිනිස් සිරුර
x. (අ) සාහිත්‍යකරුවන් විසින් රසිකයෝ අපූරු ලොවකට ගෙන යනු ලබති/ ලැබෙති / ලැබෙත් / යැවෙති.
(ආ) අනාථ දූරිය විසින් ඇගේ සහෝදරියෝ හඳුනාගන්නා ලදහ/ හඳුනාගනු ලැබූහ / හඳුනා ගැනුණහ.

(02) ලකුණු විග්‍රහය :- මුළු ලකුණු 25
01. සාරවත්භාවය, මාතෘකාවද ඇතුලුව - ලකුණු 08 යි
02. සංවිධානය , නිර්මාණාත්මක බව හා ස්වීයත්වය - ලකුණු 12 යි
03. ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි

(03) ලකුණු විග්‍රහය :-
01. ප්‍රධාන කරුණු සඳහා - ලකුණු 06 යි
02. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි
03. වචන සංඛ්‍යාව - ලකුණු 02 යි

**ආදර්ශ පිළිතුර**

නූතන භාෂාවක් ඉගැන්වීමට නව ව්‍යාකරණයක අවශ්‍යතාව කුමාරතුංග මහතා අවධාරණය කළේය. එහි මුල්ම ප්‍රතිඵලය ලෙස ව්‍යාකරණ කෘතිය එළි දැක්විණි. නමුත් එහි පළ වූයේ, පළමු කාණ්ඩය පමණක් වන අතර එහි ඇතුළත් කළ ප්‍රශ්න මඟින් පැරණි වියරණ විධි විමසුමට ලක් කෙරිණ. එම යුගයේ සිංහල ඉගැන්වීමට යොදා ගත් පොත්, සංශෝධනය කළ අතර අකුරු සැහැල්ල නමින් අලුත් පොතක් පළ කළේය. ව්‍යාකරණ විධි සම්බන්ධව ඔහුගේ ම ඇතැම් අදහස් ඔහු පසුකාලීනව වෙනස් කර නව අර්ථකථන ලබාදුන්නේය. වචන 70

මෙවැනි කරුණු ඇතුළත් පිළිතුරකට ලකුණු පිරිනමන්න.

(04) 1. වෙළඳ කටයුතු සඳහා
2. රත්රන්, රිදී, තඹ, පබළු, උසස් මැටි බඳුන්, මත්පැන්, අශ්වයන් (මින් කරුණු 02 තිබීම ප්‍රමාණවත්)
3. අම්බලන්තොට අසල ගොඩවායෙන් හමු වූ සෙල්ලිපිය
4. "බටහිර හාදකුණේ නැව්තොටුවලට එන්ට වෙළඳ නැව්වලට මඟ පෙන්වූ ධ්‍රැව තාරකාව වන්නට ඇත්තේ මැණික් ය"
5. පබළු ගෙන්වාගෙන දලක් තනවා රුවන්වැලි සෑය අලංකාර කළ බව.
( එක් කොටසකට ලකුණු දෙක බැගින් )

(05) අත් පත්‍රිකාව හා න්‍යාය පත්‍රයට - ලකුණු විග්‍රහය - ලකුණු 15 යි
1. ආකෘතියට - ලකුණු 04 යි 2. අන්තර්ගතයට - ලකුණු 08 යි 3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි

## සිංහල භාෂාව හා සාහිත්‍යය 11 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය III පත්‍රය

(01) i. (අ) නොනිමි සිත්තම හා තවත් කෙටි කතා (ආ) මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා

ii. (අ) ප්‍රබුද්ධ (ආ) මහගමසේකර

iii. (අ) බිය නොවන් අයියණ්ඩි (ආ) ජපන් 'බුන්කා' සම්මානය

iv. (අ) ගොල්ල සමඟ එහි ඌරෝ සැමදාම
නිල්ල අඹති සත් දවසින් බැලුවාම

v. (අ) අමාවතුර (ආ) පොළොන්නරුව

vi. (අ) සද්ධර්මරත්නාවලිය (ආ) ධර්මසේන හිමි

vii. (අ) කාව්‍යශේඛරය, ගුත්තිලකාව්‍ය, සඳකිඳුරු දා කව, කුසජාතක කාව්‍යය, දහම් සොඬ දා කව, වෙස්සන්තර ජාතකය. මුව ජාතකය, නිමි ජාතකය, කව්මිණි කොඩොල, කව්මිණි මල්දම (ආ) සතරවන පණ්ඩිත පරාක්‍රමබාහු

viii (අ) කුසජාතක කාව්‍යය (ආ) දම්පියා අටුවා ගැටපදය

ix. (අ) වරවෙණ නද අසමින් සිත සතොසිනි. (ආ) උපමා / උපමාලංකාර

x. (අ) ඇ, කුණාටුව, එකෝමත් එක රටක, සංවාදය (ආ) සොබාදහම, ප්‍රේමය, මනුෂ්‍ය ජීවිතය (ල.2 × 10 = 20)

(02) i. (අ) පටන් - ප්‍රථමයෙන් / පළමු ඉටන් - අධිෂ්ඨාන

(ආ) පළමුව සක්දෙව් රජු දුන් උපදෙස් සිහිකොට අධිෂ්ඨාන බලයෙන් ගුළි අහසට දමූ හෙයින් සතුට වඩන සුර අඟනෝ නවසියයක් බැස සිට නැටුම පටන් ගත්හ.

ii. (අ) ලොයිසල්

(ආ) "ඇයි ටීටර් බලන්න යනකොට ඇඳගෙන යන එක ? මට නම් ඒක හරි හොඳයි"

iii. (අ) වෙහෙසන්නාහු - උසුළු විසුළු / විහිළු තහළු සයින් - බඩගින්න / කුසගින්න

(ආ) කේවට්ට බමුණා මියුළු නුවරට දර ගෙනයාම නැවැත් වූ විට නුවර ඇතුළෙහි දර ඇති බව පෙන්වා ප්‍රතිවාදීන්ගේ ඇඟට මහ දර කඳක් දමූ අවස්ථාව

iv. (අ) නිරන්තරයෙන්ම සුළඟ ඇවිත් මල් පිපුණු ගස්වල වැදීමෙන් මල් පෙති හැලී විහාර මළුවෙහි අතුරා ඇත. අවට මල් පිපුණු විල්වල මී මැසි නාදය පැතිරෙයි.

(ආ) කැරගල පද්මාවතී පිරිවෙන් විහාරය

v. (අ) අපට වැසිකිළියක් කෙටි කථාවේ කථකයා - හේරත්ගෙ ලොකු පුතා
ප්‍රථම වතාවට / පළමු වතාවට වැසිකිළිය භාවිතයට ගැනීම. (ආ) මල්ලීට (ලකුණු 4 × 5 = 20)

03) i. අමා වතුරේ භාෂා ශෛලිය

- වියත් වහර වෙනුවට සමාන්‍ය පොදු ව්‍යවහාරය භාවිතා කිරීම.
" කිම මහරජ තට බිම්සර මහරජ කුපිත විය හො? විසාලා මහනුවර වැසි ලිච්ඡවී රජහු කුපිත වූ හො ?"
- සංවාද මිශ්‍ර භාෂාව යොදාගැනීම / සජීවී භාෂා භාවිතය
" දවස් ගිය සේ සුවදැයි පිළිවිත. " දවස් ගිය සෙ නොසුව යැ " " රෑ මාගේ මඟුල් අව් දිළිණ... " මහරජ නොබව"
- අනුප්‍රාස රසයෙන් යුත් භාෂාවක් භාවිතය
" ගම්නොගම් කෙළෙ, නියම්ගම් නොනියම්ගම් කෙළෙ, දනව් නොදනව් කෙළෙ.

ii. අවස්ථා හා සිද්ධි නිරූපණය

- තක්ෂලාවේ අනෙක් ශිෂ්‍යයෝ අහිංසකට ඊර්ෂ්‍යා කොට ගුරුතුමා හා අහිංසක ශිෂ්‍යා බිඳවන අවස්ථා හා එම සිද්ධිය.
- ගුරුතුමා අදූර දර්ශීව් තම අහිංසක ශිෂ්‍යා මිනී මරුවෙකු බවට පත් කිරීමේ සිද්ධිය.
- අංගුලිමාල අපරාධ කරුවෙකු බවට පත්වී ජන ජීවිතවලට බලපෑම් ඇතිවූ අවස්ථාව.
- අංගුලිමාල සොයා තම මව වනයට යන අවස්ථාව හා බුදුරජාණන් වහන්සේ වැඩමට කොට අංගුලිමාලට පිහිටවීම.
- බුදුරජාණන් වහන්සේ අංගුලිමාල වෙහෙසට පත්කරන අවස්ථාව හා එම සිද්ධිය.
- අගුල්මල් තෙරුන් වහන්සේ බවට පත්වන අවස්ථාව.
- අගුල්මල් තෙරුන් වහන්සේ මූඪ ගර්භ කාන්තාවට පිහිටවී දරුවා ප්‍රසූත වන සිද්ධිය.

(ඉහත අවස්ථාවන්ට හා සිද්ධීන්ට අදාල නිදසුන් හෝ වෙනත් නිදසුන් සලකන්න.)

නැතහොත්,

i) සැළලිහිණි සන්දේශයේ විවිධ අවස්ථා වර්ණනය.

- නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව් සිරිනා.... යන කවිය.
- අයි රාවණ වුවත් නවතන රිසින් එන... යන කවිය.
- මල් දම් සුවඳ දුම් දුන් සොඳ වරලසිනි ... යන කවිය.
- කස්තුරි තිලක සැදි නළලත සුමටානා.. යන කවිය.

ii) ස්වභාවෝක්තියට මුල්තැන දී ඇති අයුරු.

- සන්නන් සිහින් ගෙඩි සෙවණලු වැලි තෙලෙන යන කවිය...
- අඟ පිපි මල් මලිගිය ලිය කැලේයා... යන කවිය.
- මගනිලමින් සිටි නා දොඹ නී පියල... යන කවිය. (වෙනත් උචිත නිදසුන් සලකන්න. )

(ලකුණු නිදසුන් සඳහා 4, පැහැදිලි කිරීමට 11, මුළු ලකුණු 15)

04) i) සුප්පදේවියගේ දාරක ස්නේහය.

- ප්‍රේමවන්ත දරුවෙනි මා
හිඳිනු කන් යොමා
කියමි පුවත සැක දුරුරා
අසන නිතියෙනා...
- යන්ට වේ දැන්නම් සැමියා හැරා
වන වාසෙන් පුතු සමගා
දරුවන් දෙදෙනා
හට සෙත් ලැබෙනා
- නුඹගේ ද නුඹ නැගෙණියන්ගේ ද යහපත පිණිස නුඹ පියාණන් හැරපියා යන්නට සනිටුහන් කරගතිමි.

ii) සිංහයාගේ දාරක ස්නේහය.

- ගල්ලෙන බිඳලා
ලෙන්දොර හැරලා
සිංහබා සිංහබා සිංහබා
- " සිංහසීවලි මා ප්‍රිය දියණිය"
- ඇයි සුදු දුවණිය
නුඹවත් නොසිටියේ
- නොදනිති හසරක් නුපුරුදු එතිදෙන
පැමිණෙත පිරිපත වළකනු කෙලෙසද
දිරිඇති මුත් පුත නරයෙකි ගතමුදු
ලොව දැක නැත අද වන තුරු කිසිකල

නැතහොත්,

i) ජාතික අභිමානයෙන් හා ශ්‍රමාභිමානයෙන්

- දෑතේ කරගැට සිඹ සරසන්නට
  ළා ගොයමේ දළු පවන් සලයි.
  දහදිය මුතුඇට මල්වරුසා වී
  කරල් බරින් පීදී වැගිරෙයි.
- දෑසේ කඳුළැලි පිසදා බලනෙමි.
  හෙට හිරු එළියට වඩින දිනේ
  ණයනැති බිය නැති නිවහල් යුගයක
  පුංචිපුතා රජ කරනු පෙනේ.

ii) අතීත ශ්‍රී විභූතිය

- දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
  යළි ඉපදී ඇති මවු දෙරණේ
  සත් රුවණින් නව නිදහත් මතුවී
  පුතුගේ සිනාවෙන් ඔප වැටුණේ.
- දෙදහස් පන්සිය වසරක් තිස්සේ
  මාදුටු සිහිනය පුංචි පුතුන්
  ඔබ හට ලෝකය ඉදිකරදී මීස
  යා නොහැකිය මට පුංචි පුතුන් (ලකුණු නිදසුන් සඳහා 4, පැහැදිලි කිරීමට 11, මුළු ලකුණු 15)

5,6,7 ප්‍රශ්නයන්ට අදාළ පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න. (නිදසුන් සඳහා 3, පැහැදිලි කිරීමට 07, මුළු ලකුණු 10)